# පළාත් සභා අහෝසියට ජනවරමක් ගන්න

## - මිලින්ද මොරගොඩ



**පාර්ලිමේන්තු මහ මැතිවරණයට කලින් පළාත් සභා ඡන්දය පැවැත්විය යුතු නැති අතර එයට කලින් පවත්වන මහ මැතිවරණයකින් තුනෙන් දෙකක ජනවරමක් ලබා ආණ්ඩුව අපේක්ෂා කරන ව්‍යවස්ථා සංශෝධනය සමඟ පළාත් සභා ක්‍රමයට හේතු වූ දහතුන් වැනි සංශෝධනය අහෝසි කිරීම වෙනුවෙන් කැප විය යුතු බව පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ හිටපු අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා යෝජනා කරයි.**

පළාත් සභා ක්‍රමය අහෝසි කිරීමත් සමඟ පහළ ඒකකය වන පළාත් පාලන ආයතනවලට බලය තවදුරටත් විමධ්‍යගත කළ හැකි අතර නගර සභා, සුළු නගර සභා හා ප්‍රාදේශීය සභා බලගැන්වීමෙන් පොදු ජනතාවට සමීප එදිනෙදා ගැටලු හමුවේ පුළුල් සේවයක් කළ හැකි බව මිලින්ද මොරගොඩ මහතා පෙන්වා දෙයි. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටලුවට විසඳුමක් වශයෙන් 1987 වසරේදී පළාත් සභා ක්‍රමය ඇති කළේය. එය අතිශය අකාර්යක්ෂම, විශාල වියදමක් දරන ව්‍යුහයක් බව සනාථ වී තිබේ. සෙනෙට් හෝ උත්තර මන්ත්‍රී මණ්ඩලයක් වැනි ක්‍රමයකින් ජාතික, ආගමික හෝ ප්‍රාදේශීය බෙදීම් සම්බන්ධ ගැටලුවලට පිළිතුරු සොයාගත හැකි බවද හෙතෙම මෙහිදී පෙන්වා දෙයි.